# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය:- 216


සමාජ සේවා දෙපාර්තමේන්තුව

දෙවන මහල

සෙත්සිරිපාය - II අදියර

බත්තරමුල්ල

| | | |
|---|---|---|
| දුරකථන | - | 0112187050 |
| ෆැක්ස් | - | 0112186276 |
| ඊ - මේල් | - | dirss@sltnet.lk |
| | - | dirssdss@gmail.com |
| වෙබ් අඩවිය | - | www.socialservices.gov.lk |

## පටුන


| | | පිටුව |
|---|---|---|
| පරිච්ඡේදය 01 - | ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 03 - 22 |
| පරිච්ඡේදය 02 - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 23 - 37 |
| පරිච්ඡේදය 03 - | වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය | 38 - 43 |
| පරිච්ඡේදය 04 - | කාර්ය සාධන දර්ශක | 44 - 45 |
| පරිච්ඡේදය 05 - | තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය | 46 - 47 |
| පරිච්ඡේදය 06 - | මානව සම්පත් පැතිකඩ | 48 - 51 |
| පරිච්ඡේදය 07 - | අනුකූලතා වාර්තාව | 52 - 58 |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද සමාජ සේවා පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ සමාජ සේවා විෂයභාර අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටු කරනු ලබයි.

ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස් වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව සමාජ සේවා දෙපාර්තමේන්තුව සිය සුවිශේෂී කාර්යයන් ඉටුකරනු ලබයි. දෙපාර්තමේන්තු මෙහෙවරට අනුගත වෙමින් 2019 වර්ෂයට ලැබී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හඳුනාගත් විවිධ වැඩසටහන් සැලසුම් සහගතව බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා ක්‍රියාත්මක කොට ඇත. ඒ අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් 2019 වර්ෂයේ සිදුකරන ලද ක්‍රියාකාරකම් වලට අදාල සමස්ථ තොරතුරු මෙහි අන්තර්ගත වේ.

විශේෂයෙන්ම ආබාධ සහිත ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික යහ පැවැත්ම සුරක්ෂිත කරමින් ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම උදෙසා වැඩසටහන් රාශියක් සිදු කරන අතර ඒ අතුරින් දෙපාර්තමේන්තුව සතු ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා වන වෘත්තීය පුහුණු ආයතන, කිසිවකට නොදෙවෙනි සේවාවක් ඉටුකරනු ලබයි. විශේෂයෙන් ආබාධ සහිත තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද සුභසාධන වැඩසටහන් තුළ සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආබාධ සහිත ප්‍රජාව සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීමට ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (CBR) විධිමත් ක්‍රමවේදයන් අනුව සැලසුම් සහගතව ක්‍රියාත්මක වේ. මෙහි නව අංගයක් වන රෝහල් ගත ආබාධිත ප්‍රජාව පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ රෝහල් පද්ධතියට අනුයුක්ත නිලධාරීන් හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

මුල් ළමාවියේ දීම ළමුන්ට ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම සඳහා කල් ඇතිව මැදිහත් වී අවශ්‍ය සේවා පහසුකම් සැපයීමට අදාළව මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය හරහා ආබාධ සහිත ළමුන්ගේ සුභසාධනය උදෙසා සුවිශේෂී කාර්ය භාර්යක් ඉටු කරනු ලබයි.

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කොට ඇති ප්‍රධානතම වැඩසටහනකි. ඒ යටතේ මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම මෙන්ම ඔවුන් සමාජගත කිරීමත්, ප්‍රාදේශීය මට්ටමින් ජනතාව දැනුවත් කිරීමේ මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීමත් හරහා රටේ අනාගත පරපුරේ සුභ සිද්ධිය උදෙසා ළමා හා තරුණ ප්‍රජාව පුනරුත්ථාපනය කිරීමේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ඉලක්ක ගත ප්‍රජාවගේ ආර්ථික සාමාජීය මෙන්ම සංස්කෘතික සංවර්ධනයක් උදෙසා ද වැඩසටහන් කිහිපයක්ම ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතුරින් සිත්රූ ජාතික කලා ප්‍රසංගය, ස්වශක්ති අභිමානි ජාතික වැඩසටහන, ආබාධ සහිත වූවන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල, ජාත්‍යන්තර සුදුසැරයටි දින සැමරුම් උළෙල හා ආබාධ සහිත ළමුන්ගේ බක්මහ උළෙල මුල් තැනක් ගනී. මෙම වැඩසටහන් තුළින් දිවයිනේ සෑම ප්‍රදේශයකම විසිරී සිටින ආබාධ සහිත ප්‍රජාවගේ හැකියා හා කුසලතා වර්ධනය, වෘත්තීය පුහුණු අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ දෙමාපියන්, කාර්ය මණ්ඩලය හා සෙසු සාමාජිකයින් අතර අන්‍යොන්‍ය සුහදතාව, අවබෝධය හා විශ්වසනීයත්වය වර්ධනය කිරිම අපේක්ෂා කෙරේ.

එසේම දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අනුගත වෙමින් සියලුම සංවර්ධන වැඩසටහන් සාර්ථක කරගැනීමට දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියළුම ක්ෂේත්‍ර නිලධාරින්ගේ රෝහල්වලට අනුයුක්ත නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන වලට අනුයුක්ත නිලධාරීන්ගේ හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම ද සිදු කරනු ලබයි.

මෙකී වැඩසටහන් ප්‍රමුඛව දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ සිදු කරනු ලබන අනිකුත් සියළු ව්‍යාපෘති, වැඩසටහන් පිළිබඳව හැඳින්වීමක් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇති අතර වැය ශීර්ෂ 216 යටතේ 2019 වර්ෂයට අදාළව සමස්ථ මූල්‍ය කාර්ය සාධනය මේ තුළ අන්තර්ගත වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

"2030 වන විට ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය තහවුරු වූ සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ පුරෝගාමියා වීම "

### මෙහෙවර

"ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදීමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව,කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම , ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම "

### අරමුණු

- **වයස අවුරුදු 16 - 35 අතර ආබාධ සහිත තරුණ තරුණියන් ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් හා බාහිර ක්‍රියාකාරකම් සවිබලගැන්වීම.**
- **භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් සඳහා නේවාසික රැකවරණය ලබාදීම.**
- **වයස අවුරුදු 0 -18 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන් ගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම.**
- **ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම හා ඔවුන් සවිබලගැන්වීම .**
- **සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.**

- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන සවිබල ගැන්වීම.

- මතට ඇබ්බැහිවූවන් නේවාසික පුනරුත්ථාපනය කිරීම, ඔවුනට වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.

- විවිධ සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම .

- ශ්‍රවණාබාධිත වූවන් සඳහා ශ්‍රවණාබාධිත හැඳුනුම්පත් ලබා දීම.

- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම,කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම.

## 1.3 ප්‍රධාන කාර්යන්

- ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත වෙළඳපොළ රැකියා වෙත යොමු කිරීම.

- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනාගැනීම හා පුළුල් කිරීම.

- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීම හා පර්යේෂණ කිරීම.

- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.

- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.

- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.

- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.

- වයස අවු. 60 ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රීඩා ,අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම, ඔවුන්ගේ ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා වෙනත් සුභසාධන කටයුතු.

- ප්‍රජා මූලික පුනරුත්ථාපන සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබා දීම.

- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.

- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්ගේ දැනුම,කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු,සම්මන්ත්‍රණ වැඩසටහන් හා වැඩමුළු සඳහා යොමු කිරීම.

## 1.4 සංවිධාන සටහන
## සමාජ සේවා දෙපාර්තමේන්තුව



## 1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා ආයතන



### 1.5.1 දෙපාර්තමේන්තුවට අයත් අංශ

**පාලන අංශය**

දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමවත්, ඵලදායීවත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පාලන අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි.

එහිදී මානව හා භෞතික සම්පත් කළමනාකරණ කටයුතු, ආයතනික හා පරිපාලනමය කටයුතු සිදුකිරීමත්, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත්, දෙපාර්තමේන්තුවේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් සැපයීමත්, ඒ යටතේ පහත සඳහන් කාර්යන් සිදු කිරීමත්, පාලන අංශය මගින් සිදුකෙරේ.

- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු හා දෙපාර්තමේන්තුවේ සියළුම තැපැල පිළිබඳ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා නිළධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම, වැටුප් වර්ධක ගෙවීම, ස්ථානමාරු, හා විශ්‍රාම ගැන්වීම ආදි පෞද්ගලික ලිපිගොනුවලට අදාල සියළුම කටයුතු.
- නව තනතුරු අනුමත කරගැනීම, බඳවා ගැනීම් පරිපාටි සැකසීම, කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම ආදි රාජකාරී කටයුතු.
- කාර්ය මණ්ඩලයේ නිවාඩු, දුම්රිය බලපත්‍ර, අතිකාල දීමනා, ආපදා ණය ලබාදීමට අදාල කටයුතු.
- දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පවරා ගැනීම හා ඒ සම්බන්ධයෙන් පවතින ගැටළු නිරවුල් කිරීම හා ඊට අදාලව උපලේඛන පවත්වාගෙන යාම.
- අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාල රාජකාරී, නිවාස කුළී අයකරගැනීමට අදාල රාජකාරි, විදේශ ශිෂ්‍යත්ව, විදේශ පුහුණු හා තොරතුරු පනත ක්‍රියාත්මක කිරීමට අදාල රාජකාරී.
- කාර්යාල නියෝග ඉදිරිපත් කිරීම, දෙපාර්තමේන්තු චක්‍රලේඛ හා දෙපාර්තමේන්තුව සඳහා උපදෙස් නිකුත් කිරීම. අනෙකුත් රාජ්‍ය ආයතන වෙතින් නිකුත් කරන ලද චක්‍රලේඛ ලබාගෙන, චක්‍රලේඛ ලිපිගොනු යාවත්කාලීන කර පවත්වාගෙන යාම හා එහි සඳහන් කරුණු ක්‍රියාවට නැංවීම.
- දෙපාර්තමේන්තුවේ විදුලිය, දුරකථන, අන්තර්ජාල, ආරක්ෂක සේවා වියදම්, පිරිසිදුකිරීම් සේවා වියදම්, පුවත්පත් වියදම් සඳහා වන බිල්පත් ගෙවීම් හා දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර, උපකරණ අළුත්වැඩියා කිරීමට අදාල කටයුතු

**සංඥා භාෂා අංශය**

ශ්‍රවණාබාධිත හා අර්ධ ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා අධ්‍යාපනික ,සමාජයීය ,සංස්කෘතික සේවාවන් සැපයීමට මෙන්ම වෛද්‍ය සෞඛ්‍ය හා නෛතික පහසුකම් සැපයීම සඳහා ද සන්නිවේදන මාධ්‍ය වනුයේ සංඥා භාෂාවයි. මෙම සංඥා භාෂාව භාෂාවක් ලෙස පිළිගැනීමට 2010.09.05 දිනැතිව අමාත්‍ය මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණයක් ද ගෙන ඇත .

සංඥා භාෂා පරිවර්තන සේවය ලබාදීම වෙනුවෙන් දැනට දෙපාර්තමේන්තුවට අනුයුක්තව සංඥා භාෂා නිලධාරීන් 06 දෙනෙකු සේවය කරන අතර ඉන් නිලධාරීන් තිදෙනෙකු වෘත්තීය පුහුණු ආයතන වල ද අනෙක් නිලධාරීන් තිදෙනා ප්‍රධාන කාර්යාලයේ සංඥා භාෂා අංශයේ ද සේවය කරනු ලබයි.

ශ්‍රවණාබාධිත පුද්ගලයන්ගේ සන්නිවේදනය වෙනුවෙන් රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය සහාය ලබා දීම (උදා . ලෙස පොලිස් ස්ථාන ,අධිකරණ ,රෝහල් ,රජයේ අනෙකුත් ආයතන) මෙන්ම ජාතික රූපවාහිනී නාලිකාවේ රාත්‍රී 8.00 ප්‍රධාන ප්‍රවෘත්ති විකාශනය සඳහා ද සංඥා භාෂා පරිවර්තකයින්ගේ සේවය ලබාදෙනු ලැබේ .

**ප්‍රජා මූලික පුනරුත්ථාපන (සී.බී.ආර්) අංශය**

ආබාධ සහිත පුද්ගලයින් ප්‍රජාවේ පුනරුත්ථාපනය කිරීම හෙවත් ප්‍රජා මූලික පුනරුත්ථාපන (සී.බී.ආර්) වැඩසටහන වනාහී ආබාධ සහිත පුද්ගලයින් සඳහා සේවා සැපයීම, සමාන අවස්ථා සම්පාදනය කිරීම සහ ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කරමින් නගා සිටුවීමෙහිලා වන උපාය මාර්ගයක් වෙයි .

ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ජාතික වැඩසටහනක් ලෙස සමාජ සේවා විෂය භාර අමාත්‍යාංශය යටතේ 1994 වර්ෂයේ සී.බී.ආර් වැඩසටහන ආරම්භ කරන ලද අතර මේ වන විට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සී.බී.ආර් අංශය මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

ආබාධිතතාවන් ඇති පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල් අතරත්, ඔවුන් හා ඔවුන් ජීවත් වන ප්‍රජාවේ සමාජ සංවිධාන අතරත්, සබඳතා තර කිරීම හා ඔවුන්ගේ අන්‍යෝන්‍ය පැවැත්ම ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහනෙහි නිරත වී සිටින ක්ෂේත්‍රගත නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම, ඊට අදාල වැඩසටහන් සංවිධානය කිරීම හා මෙහෙයවීම හරහා පහත සඳහන් කාර්යන් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

- ආබාධ සහිත වූවන් සඳහා සෘජු ප්‍රතිපාදන ලබා දීම හා පසුභාර කටයුතු සිදු කිරීම
  (කොමඩ්, ජලය, විදුලි බල පහසුකම් හා ප්‍රවේශ පහසුකම් ලබා දීම. )
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා සවිබලගැන්වීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන වෙනත් සංවිධාන සමග ඒකාබද්ධ වී සේවා අවශ්‍යතා ලබා ගැනීමට පහසුකම් ඇති කිරීම.
- ආබාධිත ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීම.
- දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

**සේවා අංශය**

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින වයස අවු 16-35 අතර සිටින ආබාධ සහිත තරුණ තරුණියන් සවිබල ගැන්වීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන වෘත්තීය පුහුණුව ලබාදීමේ වැඩසටහන සඳහා අවශ්‍ය අභ්‍යාසලාභීන් බඳවාගැනීම් කටයුතු, වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කිරීම, අභ්‍යාසලාභී දීමනා ගෙවීම හා මෙවලම් කට්ටල ලබාදීම ඇතුළු සියළුම සුබසාධන කටයුතු සම්බන්ධීකරණය කිරීම මෙන්ම පහත සඳහන් කාර්යයන් ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

- ස්වෙච්ඡා සංවිධාන සඳහා නඩත්තු ආධාර හා අභ්‍යාසලාභී දීමනා ලබා දීම
- පෙර පාසල් ගුරු දීමනා ලබා දීම
- ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා හැඳුනුම්පත් ලබා දීම
- ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- මත්ලෝලී පුනරුත්ථාපන සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- මන්ද මානසික පුද්ගලයන් නිවාසගත කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු

සංවර්ධන හා සැලසුම් අංශය

සංවර්ධන අංශය මඟින් දෙපාර්තමේන්තුවේ සමස්ත ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපානු ලබන කාර්යභාරයන් රාශියක් සිදුකරනු ලබයි. විශේෂයෙන්ම නිලධාරින්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීමට සමගාමීව සිදුවන පුහුණු, දැනුම් යාවත්කාලීන කිරීම, ඵලදායිතාවයන් සංවර්ධනය කිරීම ආදිය මුල්තැනක් ගනු ලබයි.

එසේම ජාතික වැඩසටහන් සංවිධානය, සම්බන්ධීකරණය හා මෙහෙයවීම, විවිධ ව්‍යාපෘතීන්, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, තොරතුරු යාවත්කාලීන කිරීම හා නූතන සමාජ ප්‍රවණතාවයන් හඳුනාගැනීම මෙන්ම ඒවා භාවිතයට ගැනීම පිළිබඳව ද වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එයට අමතරව දෙපාර්තමේන්තුවේ අරමුණු වලට අනුගතව යමින් දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා වන පහත කාර්යයන් ද සිදු කරනු ලබයි.

- දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව පවත්වනු ලබන ජාතික වැඩසටහන් (ජාතික මලල ක්‍රීඩා උළෙල, සිත් රූ ජාතික කලා ප්‍රසංගය, බක්මහ උළෙල)සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- දෙපාර්තමේන්තු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්ය සාධන වාර්තාව හා ප්‍රගති වාර්තා සැකසීම.
- දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම.
- ජයිකා (JICA) ව්‍යාපෘතීන් වලට අදාළ ව්‍යාපෘති වාර්තා, යෝජනා ඉදිරිපත් කිරීම හා අදාළ සියළු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- රෝහල් වල රෝගී සුභසාධන කටයුතු වලට අදාළ නිලධාරින් සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු.
- අයාල ආඥා පනත සංශෝධනය කිරීමේ කටයුතු.
- අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනයේ පාඨමාලා හා භෞතික පරිසරය සංවර්ධනයට අදාල විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ආබාධිතතාවයන්ට අදාළව විවිධ සහන සැලසීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්, දර්ශක, න්‍යායන් හා නවීන මතවාද හඳුනා ගැනීම.
- ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ගිණුම් අංශය**

සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාලව මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිද භාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම ගිණුම් අංශය මඟින් ඉටු කරන ප්‍රධාන කාර්යභාරය වේ.

මෙහි ප්‍රධාන ගණකාධිකාරවරයා ගේ මඟපෙන්වීම, කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙය වීම මගින් ගිණුම් කටයුතු සිදුවන අතර මුදල් රෙගුලාසි, විශේෂ විධි විධාන හා රජයේ චක්‍රලේඛ මගින් ලබාදී ඇති බලතල අනුව පහත සඳහන් කාර්යන්ද සිදු කරනු ලබයි.

- සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් සමස්ත වාර්ෂික අයවැය ලේඛනය සකස් කර නියමිත දිනට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
- සියළුම ගණුදෙනු නිවැරදි හා යාවත්කාලීන ගිණුම් තැබීම හා ගිණුම් ඉදිරිපත් කිරීම.
- මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉහළ කළමනාකරණය වෙත සහාය වීම.
- සියලුම ලැබීම් හා වියදම් අධීක්ෂණය සහ වියදම් පාලනය.
- වියදම් සමාලෝචනය සඳහා ඉහළ කළමනාකරණය වෙත යෝජනා ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාර සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- සියළුම මිලදී ගැනීම් වලදී විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් මූල්‍ය නීතිරීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා සහය වීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින රජයේ වත්කම් යාවත්කාලීන කිරීම හා සුපරීක්ෂණය.

**අභ්‍යන්තර විගණන අංශය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 වගන්ති වල සඳහන් රාජකාරී හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයෙ හි උපදෙස් මෙන්ම 2018 අංක 19 දරන විගණන පනතේ VII කොටසෙහි 40 වගන්තියේ විධිවිධාන අනුව සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ඍජුව වාර්තා කිරීම සඳහා බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහිතව මෙම අංශය ක්‍රියාත්මක වේ.

එමෙන්ම ආයතනයේ අරමුණු කරා ළඟා වීමේදී මූල්‍ය සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, පොත්පත් හා ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම, මූල්‍ය කළමනාකරණය හා අධීක්ෂණය හා කළමනාකරණ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඵලදායි ලෙස සිදුවන බවට සහතිකවීම මෙම අංශයේ අරමුණ වේ.

## 1.5.2 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

### 1.5.2.1 වෘත්තීය පුහුණු ආයතන

ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම අරමුණු කොට ගනිමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන 08ක් ගම්පහ, මහනුවර, රත්නපුර, හම්බන්තොට හා පුත්තලම යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වේ. දිවයින පුරාම විසිරී සිටින වයස අවුරුදු 16-35ත් අතර ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීයමය හැකියාවන් බලගැන්වීම අරමුණු කර ගනිමින් පුහුණු පාඨමාලා 26ක් මෙම වෘත්තීය පුහුණු ආයතන තුළ ක්‍රියාත්මක වේ.




**වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා**

01. ගුවන්විදුලි, රූපවාහිනි යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය
02. ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පය
03. වඩු කාර්මික හා ලී කැටයම් ශිල්පය
04. මහන යන්ත්‍ර ක්‍රියා කරවීම (කර්මාන්ත ශාලා)
05. හස්ත කර්මාන්ත ශිල්පය (උණ ගස් ආශ්‍රිත සහ පොල් ආශ්‍රිත)
06. හස්ත කර්මාන්ත ශිල්පය ( කොසු සහ ඉදල් )
07. හස්ත කර්මාන්ත ශිල්පය ( වේවැල් හා කොහු)
08. හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු )

09. ඇඳුම් මැසීමේ ශිල්පය
10. ටේලරින් ශිල්පය
11. සම්බාහන චිකිත්සාව (නිල තෙරපුම)
12. පෙදරේරු කාර්මික ශිල්පය
13. මෝටර් රථ කාර්මික ශිල්පය
14. යන්ත්‍ර ශිල්පය
15. විදුලි ශිල්පය
16. මෝටර් රථ පින්තාරු ශිල්පය
17. පැස්සුම් ශිල්පය
18. සිමෙන්ති නිෂ්පාදන ශිල්පය
19. පාවහන් හා සම් කාර්මාන්ත ශිල්පය
20. බතික් නිර්මාණ ශිල්පය
21. බේකරි හා ආහාර තාක්ෂණ ශිල්පය
22. ගෙවතු වගාව හා කෘෂිකාර්මික ශිල්පය
23. පේෂ කර්ම ශිල්පය
24. පරිඝණක ශිල්පය
25. ත්‍රීරෝද රථ කාර්මික ශිල්පය
26. රූපලාවන්‍ය

**ක්‍රියාකාරකම්**

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම හා පෞරුෂ වර්ධනය
- විධිමත් පරිදි පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා සහතික පත් ලබා දීම හා සමාජ ගත කිරීම.
- ස්වයංරැකියා සඳහා මෙවලම් කට්ටල ලබා දීම හා විවෘත වෙළඳපොළ අංශයේ රැකියා අවස්ථා හඳුන්වාදීම .

## I. සීදූව වෘත්තීය පුහුණු ආයතනය

එංගලන්තයේ ෂෙනානා මිෂනාරි සංවිධානය මගින් ආරම්භ කරන්නට යෙදුන පාසැල් යටතේ කාර්මික වැඩ පලක් ලෙස දෘශ්‍යාබාධිත සහ ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා සේවාවන් ලබාදීම වෙනුවෙන් ආරම්භ කර ඇති, 1956 ඔක්තෝබර් මස 01 වන දින රජයට පවරා ගත් මෙම ආයතනය බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සීදූව ප්‍රදේශයේ පිහිටා ඇත.

ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය පුහුණුව හා පුනරුත්ථාපනය තුළින් යහපත් හා මනා ආර්ථික හා සාමාජීය තත්ත්වයන් සමාජය තුළ ඇති කිරීම මෙහෙවර කර ගනිමින් අබාධ සහිත තරුණ තරුණියන් 140 කට ආසන්න ප්‍රමාණයකට නේවාසික පහසුකම් සහිතව එක් අවුරුදු හා දෑ අවුරුදු පාඨමාලා 11ක් මඟින් වෘත්තීය පුහුණුව ලබා දීම මෙම ආයතනය මගින් සිදු කරයි.

## II. තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රදේශයේ පිහිටා ඇති මෙම වෘත්තීය පුහුණු ආයතනය 1981 වර්ෂයේ මාර්තු 28 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස ආරම්භ කර තිබේ.

ආබාධ සහිත තරුණ තරුණියන්ට ඵලදායී රැකියාවක නියුක්ත වීමට හා උසස් ජීවන තත්ත්වයක් ලබා ගැනීමට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබාදීම හා මගපෙන්වීම තුළින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායක කරවීම අරමුණු කර ගනිමින් ආබාධ සහිත තරුණ තරුණියන් 100 කට ආසන්න ප්‍රමාණයකට නේවාසික පහසුකම් සහිතව වෘත්තීය පුහුණු පාඨමාලා 08ක් ක්‍රියාත්මක කරනු ලැබේ.

## III. වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය

1963.02.15 දින ආරම්භ කරන ලද මෙම වෘත්තීය පුහුණු ආයතනය මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වත්තේගම, වාවින්න ප්‍රදේශයේ පිහිටා ඇත.

විශේෂ අවශ්‍යතා ඇති තරුණ තරුණියන් හඳුනාගැනීම, පුනරුත්ථාපනය හා වෘත්තීය පුහුණුව මගින් සවිබල ගන්වා සමාජගත කිරීම තුළින් ආර්ථිකයට දායක කර ගැනීම මෙහෙවර කර ගනිමින් දෘෂ්‍යාබාධිත තැනැත්තන් සඳහා රෙදි විවීමේ පාඨමාලාවකින් පමණක් ආරම්භ වූ මෙම ආයතනය වර්තමාන වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් විධිමත් හා ක්‍රමවත් පාඨමාලා 10 ක් පමණ පවත්වාගෙන යනු ලැබේ. මෙහිදී විශේෂ අවශ්‍යතා ඇති කාන්තා හා පිරිමි අභ්‍යාසලාභීන් 100 කට වැඩි පිරිසකට නේවාසිකව වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා සියළු පහසුකම් සලසා ඇත.

## IV. අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වතුරුගම, අමුණුකුඹුර ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ආයතනය සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සෙමෙන් මනස වැඩෙන ආබාධ සහිත වූවන් සඳහා 1990 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, එය 1991 දී වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස වැඩිදියුණු කොට ඇත.

විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාදීම තුළින් ඔවුන්ට ස්වාධීනව නැගීසිටීමට අවශ්‍ය ආර්ථික හා සමාජ පරිසරය ඇති කිරීම හා ඔවුන් සතු විභව ශක්තිය බලගැන්වීම මෙහෙවර කර ගනිමින් ආබාධ සහිත ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් 100 කට ආසන්න ප්‍රමාණයකට නේවාසික පහසුකම් සහිතව වෘත්තීය පුහුණු පාඨමාලා 06ක් මේ තුළ ක්‍රියාත්මක වේ.

## V. කැටවල වෘත්තීය පුහුණු ආයතනය

1968 දී ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේ ආධාර මත ආරම්භ කර ඇති මෙම වෘත්තීය පුහුණු ආයතනය මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කොරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කැටවල, ලෙව්ල ප්‍රදේශයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබා දී, ඵලදායී රැකියාවක නියුක්ත වීමට හා හොඳ ජීවන තත්ත්වයක් ලබා ගැනීමට අවශ්‍ය පරිසරය ගොඩනැගීමත්, ඔවුන් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කිරීමත් මෙහෙවර කර ගනිමින් ආබාධ සහිත අභාසලාභීන් 50කට ආසන්න සංඛ්‍යාවකට නේවාසික පහසුකම් සහිතව දෑ අවුරුදු වෘත්තීය පුහුණු පාඨමාලා 06ක් පවත්වාගෙන යනු ලැබේ.

## VI. රාගම වෘත්තීය පුහුණු ආයතනය

1984 ජනවාරි මස 28 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව එක්ව සුෂුම්නා ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් වෘත්තීය පුහුණුව ලබාදීමේ අරමුණින් යුතුව බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රාගම පුනරුත්ථාපන රෝහලේ මෙම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත.

ආබාධ සහිත වූවන් වෙත කාර්යක්ෂම හා වඩා ඵලදායී වෘත්තීය පුහුණුවක් ලබාදීම මගින් ඔවුන්ගේ සුවිශේෂී දක්ෂතාවයන්, හැකියාවන් ඔපමට්ටම් කර ජීවන තත්ත්වය නගා සිටුවීමෙන් සමාජ සංවර්ධනයේ සක්‍රිය කොටස්කරුවන් බවට පත් කිරීම වෙනුවෙන් ඇප කැප වී කටයුතු කිරීම මෙම ආයතනයේ මෙහෙවර කර ගනිමින් සුෂුම්නා ආබාධ සහිත රෝගීන් වෘත්තීමය වශයෙන් සවිබල ගැන්වීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා පාඨමාලා 04ක් පමණ ක්‍රියාත්මක කරනු ලබයි.

## VII. මාදම්පෙ වෘත්තීය පුහුණු ආයතනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාදම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පොතුවිල ප්‍රදේශයේ ආබාධ සහිත වූවන් සඳහා වෘත්තීය පුහුණුව සමඟ රැකවරණ මධ්‍යස්ථානයක් ලෙස වර්ෂ 2006 දී ආරම්භ කරන ලද මෙම ආයතනය 2014 ජූලි මස 15 වන දින වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව සම්පත් සම්බන්ධීකරණයෙන් හා ජනතා සහභාගීත්වයෙන් යුත් තිරසාර සැලසුම් සහගත ක්‍රියාවලියක් තුළින් විශේෂ අවශ්‍යතා ඇති දැයේ දූ දරුවන් තිරසාර සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීම මෙහෙවර කර ගනිමින් අබාධ සහිත අභ්‍යාසලාභීන් 30 කට ආසන්න ප්‍රමාණයකට නේවාසික පහසුකම් සහිතව වෘත්තීය පුහුණු පාඨමාලා 03ක් මගින් වෘත්තීය පුහුණුව ලබා දේ.

## VIII. කලවාන වෘත්තීය පුහුණු ආයතනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශයේ, පහළ කුකුළේගම ප්‍රදේශයේ පිහිටා ඇති මෙම ආයතනය 2006 මාර්තු 24 දින බුද්ධිමය ඌණතා සහිත පිරිමි දරුවන්ට වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා ආරම්භ කරන ලද අතර 2015 මාර්තු මස 01 දින සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතට පවරාගෙන ඇත.

ආබාධ සහිත පුද්ගලයාගේ විභවතා හඳුනාගෙන, ප්‍රධාන ප්‍රවාහයට ඔවුන් අන්තර්ග්‍රහණය කිරීමේ උපාය මාර්ගයක් ලෙස වෘත්තීය පුහුණුව ලබා දීම හා ඒ තුළින් ඔවුන්ට සමාජානුයෝජනයට හා ජීවනෝපායට ඇති අයිතිය තහවුරු කිරීම උදෙසා වන ආයතනික කාර්ය භාරය ඉටු කිරීම මෙහෙවර කර ගනිමින් ආබාධ සහිත පිරිමි දරුවන් 30 කට ආසන්න ප්‍රමාණයකට නේවාසික පහසුකම් සහිතව වෘත්තීය පුහුණු පාඨමාලා 03ක් මගින් වෘත්තීය පුහුණුව ලබා දේ.

### 1.5.2.2 ජයවිරු සමාධි පුනරුත්ථාපන ආයතනය

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම , සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා 2001 වර්ෂයේ ආරම්භ කර ඇති මෙම ආයතනය බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පුවක්පිටිය නොර්ත් අම්බලන්වත්ත ප්‍රදේශයේ පිහිටා ඇත.

සැබෑ ජීවන දර්ශනය හා ජීවිතයේ සැබෑ සතුට කියා දීමත් හැකියාවන් ඔප් නැංවීමත් තුළින් මතට ඇති නැඹියාව අවම කර මතට බිලිවූ තරුණ පරපුර ජාතික සංවර්ධනයට දායක කර ගැනීම මෙහෙවර කර ගනිමින් විවිධ මත්ද්‍රව්‍ය වලට අබ්බැහි වූ මත්ලෝලීන් 100 කට ආසන්න ප්‍රමාණයක් නේවාසිකව පුනරුත්ථාපනය කරනු ලබයි.

**ක්‍රියාකාරකම්**

- මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් වැඩි දියුණු කිරීම හා සමාජ ගත කිරීම.
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම නිසා ඔවුන්ගේ පවුල් පරිසරය තුළ හටගෙන ඇති ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම.
- මත්ද්‍රව්‍ය භාවිතය නිසා බිඳවැටුණු රැකියාවන් හා අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට ගෙන ඒම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධතා ගොඩනැගීම.
- අවදානම් කණ්ඩායම් සඳහා මත් ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

### 1.5.2.3 ජයවිරු සෙවණ රැකවරණ නිවහන

දෙමාපිය රැකවරණය අහිමි මන්ද මානසික ආබාධ සහිත පිරිමි දරුවන් සඳහා රැකවරණය සැපයීම වෙනුවෙන් 2007 ජූලි මස 31 වන දින ආරම්භ කරන ලද ජයවිරු සෙවණ ආයතනය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුවක්පිටිය නොර්ත් අම්බලන්වත්ත ප්‍රදේශයේ පිහිටා ඇත.

බුද්ධිමය ඌණතාවක් සහිත ප්‍රජාවට සෙනෙහස හා ආදරය ලබා දීම තුළින් හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වර්ධනයට අවස්ථාවක් සලසා දීමෙන් හා ඔවුන් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරවීමෙන් ජාතික සංවර්ධනයේ කොටස් කරුවන් කරවීම මෙහෙවර කර ගනිමින් මෙම ආයතනය මඟින් මන්ද මානසික පිරිමි දරුවන් 75 කට ආසන්න ප්‍රමාණයක් සඳහා නේවාසික රැකවරණය සලසනු ලබයි.

#### 1.5.2.4 නාවින්න ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය

ආබාධ සහිත ළමුන් සඳහා සේවා සැපයීමට කල් ඇතිව මැදිහත්වීමේ වැඩසටහන යටතේ හඳුන්වාදෙන ලද සංකල්පයකට අනුව 2003 වර්ෂයේදි මෙම ආයතනය බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නාවින්න, පතිරගොඩ ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත.

දෙමාපියන් හා පවුලේ සාමාජිකයන් අභියෝග වලට අභිමානවත්ව මුහුණදීම සඳහා සවිබලගන්වමින්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ උපරිම සංවර්ධනය සඳහා කල් ඇතිව මැදිහත්වෙමින්, දිරිගන්වමින් නිසි වේලාවට ලබා කරන්නාවූ සේවා ජාලයක් ගොඩනැංවීමේ හා සම්බන්ධීකරණය කිරීමේ මැදිහත්කරුවකු වශයෙන් කටයුතු කරමින් සේවාලාභීන් අමන්දානන්දයට පත්කිරීම මෙහෙවර කර ගනිමින් ආබාධ සහිත දරුවන් 80 කට ආසන්න ප්‍රමාණයක් සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

**ක්‍රියාකාරකම්**

- ළමා ආබාධ කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා මැදිහත්වීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ සේවා ජාලය ශක්තිමත් කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.
- දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයට ගෙන ඒම සඳහා උපදේශන සේවා පවත්වාගෙන යාම.

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

### දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

දෘශ්‍යාබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම, පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙම අරමුදලේ මෙහෙවර වේ. ශ්‍රී ලංකාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් විවිධ සේවාවන් ක්‍රියාත්මක කරමින් සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ මෙම අරමුදල පවත්වාගෙන යනු ලබයි.

**ක්‍රියාකාරකම්**

- ස්වයං රැකියා කරගෙන යාම සඳහා ආධාර සැපයීම.
- ක්‍රීඩා කටයුතු පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීමට ආධාර සැපයීම.
- අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීම.
- උසස් පෙළ හදාරන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා මුදල් ආධාර සැපයීම.
- අඩු ආදායම්ලාභීන්ට නොමිලයේ අක්ෂිකාච ලබා දීම.
- සුභසාධන කටයුතු පවත්වාගෙන යාම.
- දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.
- විභාග ගාස්තු ගෙවීම.
- අවශ්‍යතා මත අරමුදලේ පරමාර්ථයන් ඉටු කිරීම සඳහා විවිධ වියදම් දැරීම.
- චලතාවය හා දිශානතිය පුහුණු ලබාදීම සඳහා උපදේශන දීමනා ගෙවීම.

## 1.7 විදේශාධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

**ව්‍යාපෘතිය I** – " Project for Promoting Support Participation of Person with Disabilities through Introduction of a Job Coach & Service Improvements in Pilot Project Areas."

**පාර්ශවකරුවන්** - Japan International Cooperation Agency – JICA
**ව්‍යාපෘති පිරිවැය** - රුපියල් මිලියන 360
**ව්‍යාපෘති කාල සීමාව** - වසර 04

**ව්‍යාපෘතිය II** – " Increase Employability of Visually Impaired Persons through the Formation & Establishment of a Japanese Medical Manual therapy Course in Sri Lanka"

**පාර්ශවකරුවන්** - Japan International Cooperation Agency – JICA
**ව්‍යාපෘති පිරිවැය** - රුපියල් මිලියන 9.6
**ව්‍යාපෘති කාල සීමාව** - වසර 02

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැඩසටහන් හා ව්‍යාපෘති වල ප්‍රගතිය

### 2.1.1 ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහන

- ❖ ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම හා සමාජගත කිරීම.
- ❖ මුල් ළමාවියේදීම ඇතිවන ආබාධ සහිත තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත් වීම හා සංවර්ධනය කිරීම.
- ❖ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන ජාතික වැඩසටහන .
- ❖ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල.
- ❖ ආබාධ සහිත දරුදැරියන්ගේ ක්‍රීඩා හා කලා කුසලතා වැඩසටහන.

**❖ ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා පුනරුත්ථාපනය කිරීම, වෘත්තිය පුහුණුව ලබා දීම හා සමාජගත කිරීම.**

දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතන 08ක් සඳහා ඇතුලත් කර ගන්නා ආබාධ සහිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ. ගම්පහ, මහනුවර, රත්නපුර, හම්බන්තොට හා පුත්තලම යන දිස්ත්‍රික්කවල මෙම වෘත්තීය පුහුණු ආයතන පිහිටුවා ඇති අතර දිවයින පුරාම විසිරී සිටින ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම ඒ මඟින් සිදු කෙරේ.

වයස අවු. 16 – 35 ත් අතර කිසියම් පුහුණුවකට සුදුසුකම් ඇති ආබාධ සහිත තරුණ තරුණියන් සම්මුඛ පරික්ෂණයකින් පසු ඔවුන්ගේ හැකියාවන්ට ගැලපෙන පුහුණු පාඨමාලාවන් සඳහා තෝරා ගැනේ. පාඨමාලාවේ ස්වභාවය අනුව පුහුණු කාලය වෙනස් වන අතර ඒ අනුව වසරක හෝ වසර දෙකක විධිමත් පුහුණුවක් තෝරාගත් අභ්‍යාසලාභීන් සඳහා ලබාදේ. විවිධ වූ පාඨමාලා 26ක් යටතේ මෙම පුහුණුව ලබාදෙන අතර පුහුණු කාලය තුළ නේවාසික පහසුකම්, ආහාරපාන, දෛනික දීමනා හා වෛද්‍ය පහසුකම් නොමිලේ සැපයේ. 2019 වර්ෂයේ සාර්ථකව පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා සඳහා මෙවලම් කට්ටල හා විධිමත් සහතික පත්‍ර ලබාදී ඔවුන් රැකියාගත කිරීමට හා සමාජගත කිරීමට කටයුතු කර ඇත.

**2019 වර්ෂයේ වෘත්තීය පුහුණු ආයතන අනුව අභ්‍යාසලාභීන් ගණන**

| අනු අංකය | ආයතනය | 2019 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | සීදුව වෘත්තීය පුහුණු ආයතනය | 98 |
| 02. | කැටවල වෘත්තීය පුහුණු ආයතනය | 44 |
| 03. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | 104 |
| 04. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | 93 |
| 05. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | 73 |
| 06. | කලවාන වෘත්තීය පුහුණු ආයතනය | 28 |
| 07. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | 30 |
| 08. | රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 30 |
| | එකතුව | 500 |

**2019 සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ස්වේච්ඡා ආයතනවල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සඳහා දීමනා ලබාදීම.**

| අනු අංකය | ආයතනය | 2019 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ආබාධිත පුද්ගල සංවර්ධන පදනම - බණ්ඩාරවෙල | 26 |
| 02 | බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය -බලංගොඩ | 22 |
| 03. | මන්ද මානසික කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - රොටුව | 26 |
| 04. | ජාතික මානසික සෞඛ්‍ය සභාව - කොළඹ | 20 |
| 05. | කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - රාජාංගනය | 44 |
| | එකතුව | 138 |

**ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

**වැය ශීර්ෂය 216 - 02- 03 - 1- 1501 (2019/12/31 දිනට )**

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| **01.** | පුහුණුව සඳහා අමුද්‍රව්‍ය හා වෙනත් | | |
| | I. අමු ද්‍රව්‍ය<br>II. වෙනත් සුභසාධන වියදම්<br>III. උපදේශන පුහුණු දීමනා<br>IV. අධ්‍යාපන චාරිකා | | 14,326,673.00 |
| **02.** | විධිමත් පරිදි වෘත්තීය පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල ලබා දීම. | | |
| | I. රු. 15,000/- ක් වටිනා මෙවලම් කට්ටල 102ක් ලබාදීම.<br>II. අභ්‍යසලාභීන් 45 දෙනෙකු සඳහා මහන මැෂින් 45ක් ලබාදීම | | 1,586,194.00<br>1,604,250.00 |
| **03.** | ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය | | |
| | I. සේවාලාභීන්ගේ පැමිණීමේ දීමනාව ලබා දීම.<br>II. සංග්‍රහ වියදම්<br>III. චිකිත්සකවරුන් සඳහා දීමනා | | 1,697,172.00 |
| **04.** | දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සංවිධානවල නඩත්තු හා යථායෝග්‍යාධාර ලබාදීම. | | |
| | I. බිහිරි සේවා මණ්ඩලය<br>II. ස්වර්ණදාම පදනම | 34,000,000.00 | 100,000.00 |
| **05.** | බුද්ධි ඌණතා ළමුන් සඳහා වන පෙර පාසල් ගුරුවරුන් හට දීමනා ලබා දීම | | |
| | I. වීරකැටිය අරුණැල්ල විශේෂ පාසැල - ගුරුවරුන්- 02ක්<br>II. හ/කටුවන රිටිගහයාය පෙර පාසල- ගුරුවරුන් - 02ක්<br>III. බඩල්කුඹුර ලිට්ල් ෆ්ලවර්ස් ළමා කුසලතා | | 1,530,000.00 |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරු - 03ක්<br>IV. නුවරඑළිය වොල්ට්‍රීම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය -ගුරුවරුන් - 03ක්<br>V. තෝලංගමුව ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - ගුරුවරුන් - 03<br>VI. ඉබ්බාගමුව විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය ගුරුවරුන් - 01<br>VII. මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය ගුරුවරුන් - 01<br>VIII. ළමා කුසලතා මධ්‍යස්ථානය - අක්මීමන ගුරුවරුන් 01<br>IX. ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ගැට්ටුවාන- ගුරුවරුන් 01 | | |
| **06.** | 2019 - ජාතික මලල ක්‍රීඩා සඳහා - ටී - ෂර්ට්, බොටම්, කැප් ,සපත්තු ,මේස් | | 2,683,336.00 |
| **07.** | සිත් රූ 2019 ජාතික සංස්කෘතික කලා මංගල්‍යය සඳහා තෑගි සහ වස්ත්‍රාභරණ | | 2,689,615.00 |
| **08.** | වෘත්තීය පුහුණු ආයතන නිල ඇඳුම් - ටී - ෂර්ට් බොටම් | | 1,583,560.00 |
| **09.** | ස්වේච්ඡා ආයතනවල අභ්‍යාසලාභීන් සඳහා ප්‍රවාහන,තේ සහ කෙටි ආහාර දීමනා | | |
| | I. නුවරඑළිය - වොල්ට්‍රීම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>II. තෝලංගමුව ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය<br>III. රාජාංගනය කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>IV. ඉබ්බාගමුව විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානය<br>V. බඩල්කුඹුර ළමා සංවර්ධන මධ්‍යස්ථානය<br>VI. මාලමුල්ල කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>VII. ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය ගැට්ටුවාන | | 2,566,200.00 |
| **10.** | ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම - 418 | | |
| **11.** | ශ්‍රවණාබාධිතයන් සඳහා සංඥා භාෂා පරිවර්තක සේවය ලබා දීම - 750 | | |
| | එකතුව | 34,000,000.00 | 30,367,000.00 |

ආබාධ සහිත වූවන්ගේ සුභසාධන වැඩසටහන භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය 216-02-03-13 – 1501 (2019/12/31 දිනට)

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත අභ්‍යාසලාභීන් 500 ක් සඳහා අභ්‍යාසලාභී දීමනා (එක් ළමයෙකුට රු. 150/-) | 35,000,000.00 | 25,894,800.00 |
| 02. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා වෘත්තීය පුහුණු ආයතනවල අභ්‍යාසලාභීන් 138ක් සඳහා අභ්‍යාසලාභී දීමනා (එක් අභ්‍යාසලාභියෙකුට පැමිණි දිනකට රු.75/- ක්ද ආයතනයට රු 75/-ක්ද බැගින් දිනකට රු.150/-ක දීමනාවක්) | | |

❖ ළමා මාර්ගෝපදේශන වැඩසටහන

ළමයෙකුගේ මුල් ළමාවියේ දී වර්ධනයේ කිසියම් වෙනසක් හෝ ප්‍රමාදයක් හෝ ඇති බවට සැක සහිත අවස්ථාවක ඒ සඳහා කල් ඇතිව මැදිහත් වී දරුවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය මෙම වැඩසටහන මඟින් ලබා දීම සිදුකෙරේ. නිවැරදි මාර්ගෝපදේශයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ආයතනයට පැමිණෙන දෙමාපියන් සඳහා මූලිකවම සිදුකෙරෙනුයේ දරුවාගේ ජීවන තොරතුරු ලබාගෙන දරුවා ලියාපදිංචි කර, දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන වර්ධන තත්ත්වයේ නිවැරදි තක්සේරුවක් සහතික කරවා ගැනීමයි. විස්තරාත්මක තත්ත්ව වාර්තාවක් සැකසීමෙන් අනතුරුව ගුරුවරුන්, දෙමාපියන් සමඟ සාකච්ඡා කර දරුවන්ගේ කුසලතාවයන් අනුව සුදුසු පන්ති කාමරයකට යොමු කිරීම සිදුකෙරේ. මෙම දරුවන්ගේ වර්ධන තත්ත්වයන් හා කුසලතාවන් පිළිබඳ වාර්තා අර්ධ වාර්ෂිකව සකස් කරන අතර තවදුරටත් සේවා ලබා ගැනීමට අවශ්‍යනම් දිගුකාලීනව පසුහාර කටයුතු සිදුකෙරේ.

- 2019 වර්ෂයේ ලියාපදිංචි වූ නවක ළමුන් සංඛ්‍යාව - 49
- පෙර පාසල් වලට යොමු කළ ළමුන් සංඛ්‍යාව - 07
- පාසල් වලට යොමු කළ ළමුන් සංඛ්‍යාව - 18

**2019 වර්ෂයේ ලියාපදිංචි නවක සේවාලාභීන් ගණන - 49 ( පිරිමි ළමුන් 38 /ගැහැණු ළමුන් 11)**

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම් | මස්තිෂ්ක ආඝාතය | ඩවුන් සින්ඩ්‍රෝම් | වර්ධනය ප්‍රමාද | කථනාබාධ | අධි ක්‍රියාකාරී | ශ්‍රවණාබාධ | මන්ද මානසික | වෙනත් | |
| **0 – 03** | - | 01 | - | 01 | - | - | - | - | 02 | **04** |
| **03 – 05** | 02 | 01 | 01 | 06 | - | - | - | - | 02 | **12** |
| **05 - 15** | 10 | - | 03 | 04 | 02 | - | 01 | 02 | 07 | **29** |
| **15 - 18** | 01 | 01 | - | - | 01 | - | - | 01 | - | **04** |
| **18 ට වැඩි** | - | - | - | - | - | - | - | - | - | |
| එකතුව | **13** | **03** | **04** | **11** | **03** | **-** | **01** | **03** | **11** | **49** |

**2019 වර්ෂයේ මුළු සේවාලාභීන් සංඛ්‍යාව - 105** ( පිරිමි 67 /ගැහැණු 38)

| වයස පරාසය (අවු.) | ආබාධයේ ස්වභාවය | | | | | | | | | මුළු ළමුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඔටිසම් | මස්තිෂ්ක ආඝාතය | ඩවුන් සින්ඩ්‍රෝම් | වර්ධනය ප්‍රමාද | කථනාබාධ | අධි ක්‍රියාකාරී | ශ්‍රවණාබාධ | මන්ද මානසික | වෙනත් | |
| **0 - 03** | **-** | **-** | **03** | **02** | **-** | **-** | **-** | **-** | **03** | **08** |
| **03 - 05** | **05** | **03** | **04** | **06** | **03** | **01** | | | **01** | **23** |
| **05 - 15** | **13** | **13** | **07** | **17** | **-** | **04** | **02** | **03** | | **59** |
| **15 - 18** | **-** | **02** | **03** | **03** | **02** | **01** | **-** | **-** | **-** | **11** |
| **18 ට වැඩි** | **-** | **01** | **-** | **02** | **-** | **-** | **-** | **01** | | **04** |
| එකතුව | **18** | **19** | **17** | **30** | **05** | **06** | **02** | **04** | **04** | **105** |

එක් එක් අංශ මගින් ලබාදුන් සේවා පිළිබඳ විස්තර

| අංකය | ලබා දුන් සේවය | ළමුන් සංඛ්‍යාව | සේවා වාර ගණන |
|---|---|---|---|
| **01** | භෞත චිකිත්සක සේවා | 55 | 221 |
| **02** | කථන චිකිත්සක සේවා | 105 | 804 |
| **03** | වෘත්තිය චිකිත්සක සේවා | 61 | 138 |
| **04** | අධ්‍යාපන හා පූර්ව වෘත්තීය පුහුණු | **97** | 6540 |

❖ **දෙමාපියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන් සඳහා රැකවරණය ලබා දීම.**

දෙමාපියන් සහ භාරකරුවන් අහිමි විවිධ වයස් මට්ටම් ඇති බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන්ට රැකවරණය ලබා දීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. මුළු ජීවිත කාලයම නේවාසිකව සිටින මෙම ළමුන් හුදකලා නොකොට ආදරයෙන් සෙනෙහසින් රැකබලා ගන්නා අතරම දෛනික ක්‍රියාකාරකම් සඳහා යොමු කෙරේ. නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම සිදුකෙරේ.

**2019 වර්ෂයේ රැකවරණය ලබාදුන් ළමුන් - ආබාධ මට්ටම් අනුව**

| අනු අංකය | ආබාධිත තත්ත්වය | සංඛ්‍යාව |
|---|---|---|
| 01. | **මන්ද මානසික** | **58** |
| 02. | **මානසික රෝගී** | **04** |
| 03. | **කථන හා ශ්‍රවණ** | **04** |
| 04. | **චලන** | **04** |
| 05. | **දෘෂ්‍ය** | **03** |
| 06. | **බහුවිධ** | **01** |
| එකතුව | | **74** |

❖ **ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන (සී. බී. ආර්.)**

ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික ප්‍රතිපත්තියට අනුව ,ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් වගකීම් හා යුතුකම් ඉටු කිරීමට හැකිවනු පිණිස ඔවුන් දැනුමෙන් හා කුසලතාවලින් සවිබලගැන්වීම මෙම වැඩසටහන තුළින් ප්‍රධානවම සිදුකෙරේ. එසේම එම ප්‍රජාවගේ පවුල්වල සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජයීය යහපැවැත්ම තහවුරු කිරීමේ විවිධ වැඩසටහන්ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

**ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**වැය ශීර්ෂය 216 -02 -03 -5 – 2509 (2019/12/31 දිනට**

| ව්‍යාපෘතිය | වැඩසටහන | භෞතික ප්‍රගතිය | ඇස්තමේන්තුව රු.මිලියන | වියදම රු.මිලියන |
|---|---|---|---|---|
| ස්වශක්ති සංවිධාන ඇගයීම -2019 | බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ස්වශක්ති සංවිධාන ඇගයීම - ත්‍යාග හා සම්මාන ප්‍රදානය | ජාතික මට්ටම දක්වා ඇගයීම් කර ඇත | 3.5 | 0.853 |
| සෘජු ආධාර | ආබාධිත ප්‍රජාව සඳහා<br>• කොමඩ් වැසිකිළි<br>• විදුලි බල පහසුකම්<br>• ප්‍රවේශ මාර්ග පහසුකම්<br>• වායු මෙට්ට ලබා දීම<br>• ජල මෙට්ට ලබාදීම<br>• ජල පහසුකම්<br>• වෙනත් ආධාර | 463 | 6.875 | 6.843 |
| ස්ව ශක්ති වැඩසටහන හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රගති සමාලෝචනය | ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක වැඩසටහන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම, රැස්වීම් පැවැත්වීම වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | ප්‍රාදේශිය - 1320<br>දිස්ත්‍රික් - 144 | 1.75 | 1.75 |
| ප්‍රචාරණ කටයුතු | සීබීආර් වැඩසටහනට අදාලව දැනුවත් කිරීම සඳහා පත්‍රිකා මුද්‍රණය කිරීම | අත් පත්‍රිකා 5000 | 0.075 | 0.07 |
| දිස්ත්‍රික් මට්ටමේ | සීබීආර් වැඩසටහනට අදාලව සෘජු | | | |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රගතිය පරීක්ෂා කිරීම | ආධාර ලබාදීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම | 2 | 0.02 | 0.02 |
| රෝහල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | රෝගීන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 2 | 0.1 | 0.07 |
| පුහුණු වැඩසටහන් | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සඳහා සී.බී.ආර් වැඩසටහන් සම්බන්ධයෙන් ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබාදීම | 2 | 1.68 | 1.065 |
| ජාතික මෙහෙයුම් කමිටුව | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ සී.බී.ආර් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අන්තර් ආයතනික සම්බන්ධතාවයන් ගොඩනැගීම හා ප්‍රතිපත්ති තීරණය කිරීම | 1 | 0.05 | 0.024 |
| ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන / සාකච්ඡා ප්‍රධාන කාර්යාලය | දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කරන සී.බී.ආර්. වැඩසටහන්වල ප්‍රගතිය සාකච්ඡා කිරීම හා නිලධාරීන් මුහුණපාන ගැටලු සමාලෝචනය කිරීම | 6 | 0.1 | 0.095 |
| සී.බී.ආර්. අංශයේ පරිපාලන කටයුතු හා ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් කරනු ලබන විවිධ වැඩසටහන් | සී.බී.ආර්. අංශයේ ලිපිද්‍රව්‍ය හා සන්නිවේදන පහසුකම් හා කාලීන අවශ්‍යතා අනුව ක්‍රියාත්මක වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබා දීම | 6 | 1.85 | 1.74 |
| එකතුව | | | **16.00** | **12.53** |

❖ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය

වැය ශීර්ෂය 216-02-03-3-1508 2019/12/31 දිනට

| අනු අංකය | වැඩසටහන හා ප්‍රගතිය | ඇස්තමේන්තුව රු | වියදම රු |
|---|---|---|---|
| 01 | ක්‍රීඩා ආධාර | 165,000.00 | 163,100.00 |
| | I. ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම<br>II. දිරිය ශක්ති ක්‍රීඩා සමාජය<br>III. රත්මලාන අන්ධ විද්‍යාලය | | |
| 02 | වෘත්තීය පුහුණු උපදේශක දීමනා | 500,000.00 | 480,000.00 |
| | I. සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ සංගීත ගුරු දීමනා ගෙවීම.<br>II. සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ වෙස් ක්‍රීඩා උපදේශක වෙත දීමනා ගෙවීම.<br>III. බලංගොඩ බටුගම්මන රියන්සි අලගියවන්න ආබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ කොහු උපදේශක වෙත දීමනා ගෙවීම<br>IV. දුරකතන ක්‍රියාකරු පුහුණු දීමනා ගෙවීම - 01<br>V. ගුරු සහායක දීමනා ගෙවීම - 03 | | |
| 03 | පුනරුත්ථාපන ආධාර | 650,000.00 | 648,140.00 |
| | I. අන්ධ ජන සේවා මණ්ඩලයේ උපදේශකවරුන් 05 ක් සඳහා ගෙවීම් කිරීම<br>II. පුහුණුලාභීන් 07ක් සඳහා ගෙවීම් කිරීම<br>III. කථන ග්‍රන්ථ 50ක් සැකසීම | | |
| 04 | අධ්‍යාපන හා සංස්කෘතික ආධාර | 5,600,000.00 | 5,616,760.00 |
| | I. පාසල් සිසුන් 451ක් සඳහා ශිෂ්‍යාධාර ගෙවීම<br>II. විශ්ව විද්‍යාල සිසුන් 29 ක් සඳහා ඩේසි රෙකෝඩර් ලබා දීම<br>III. කාලය සහරාව සඳහා ආධාර ලබාදීම | | |
| 05 | ජාත්‍යන්තර සුදු සැරයටි දින සැමරුම් ජාතික උත්සවය | 1,200,000.00 | 1,206,870.00 |
| | I. දෘශ්‍යාබාධිත වූවන් 350ක සහභාගීත්වයෙන් | | |

| | | | |
|---|---|---|---|
| | සුදුසැරයටි දින සැමරුම් උත්සවය 2019 ඔක්තෝබර්15 වන දින සුහුරුපාය ශ්‍රවණාගාරයේ දී පැවැත්වීම. | | |
| 06 | අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර | 55,000.00 | 53,800.00 |
| | අක්ෂි කාච 04 | | |
| 07 | දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය | 15,000.00 | 10,500.00 |
| | උපදේශිකා 01<br>සහායිකා 01<br>දෘශ්‍යාබාධිත කාන්තාවන් 10 | | |
| 08 | පරිපාලන වියදම් | 755,000.00 | 758,880.00 |
| 10 | මුල්‍ය වියදම් | 30,000.00 | 27,740.00 |
| 11 | විවිධ වියදම් | 30,000.00 | 34,210.00 |
| | එකතුව | 9,000,000.00 | 9,000,000.00 |

❖ ආබාධ සහිත දරුදැරියන්ගේ සංස්කෘතික හා කලා කුසලතා සංවර්ධන වැඩසටහන

සමාජ සේවා දෙපාර්තමේන්තුව ආබාධ සහිත දරුදැරියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම සිදු කරන අතරම ඔවුන් සෞන්දර්යයෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස සමාජගත කිරීම සඳහා ද මූලික වී කටයුතු සිදු කරයි. ඒ සඳහා දිවයිනේ සියළුම ආබාධිත තරුණ තරුණියන් නියෝජනය වන පරිදි ඔවුන්ගේ ක්‍රීඩා හා කලා කුසලතාවන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගෙන සෑම වසරකම ජාතික ක්‍රීඩා හා කලා ප්‍රසංග පැවැත්වීම සිදු කොට ඇත. දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද තරඟ වලින් ජයග්‍රහණය කරන පුද්ගයින් හා කණ්ඩායම් ජාතික මට්ටමේ තරග සඳහා යොමු කිරීමත් ඉන් අනතුරුව ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග, සම්මාන හා සහතික පත් පිරිනැමීමත් සිදු කෙරේ.

ශ්‍රී ලාංකීය සංස්කෘතික සිරිත් විරිත් පිළිබඳ සජීවී අත්දැකීම් විඳගැනීමේ අවස්ථාව ආබාධ සහිත දරුවන්ට ලබා දීම, සෙසු අය මෙන් මොවුන්ගේ ක්‍රිඩාව සහ නර්තනය කෙරෙහි තිබෙන හැකියාව ඔප් නැංවීම, ආබාධිත ප්‍රජාව පිළිබඳ සමාජයේ තිබෙන පාරම්පරික සාවද්‍ය ආකල්ප වෙනස් කිරීම හා ඔවුන් සමාජ පිළිගැනීමට ලක්කිරීම මෙම වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ. මේ යටතේ ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන ජාතික වැඩ සටහන් 03 කි.

i. ආබාධ සහිත දරු දැරියන්ගේ ජාතික කලා ප්‍රසංගය - "සිත් රූ"
ii. ආබාධ සහිත තැනැත්තන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල
iii. ආබාධ සහිත දරුවන්ගේ බක්මහ උළෙල

මූල්‍ය හා භෞතික ප්‍රගතිය - 2019/12/31 දිනට

වැය ශීර්ෂය 216 - 02 – 03 - 8 - 1508

| අනු අංකය | වැඩසටහන | ස්ථානය හා දිනය | ප්‍රතිපාදන රු.මිලියන | වියදම රු.මිලියන | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| **01.** | ආබාධ සහිත වූවන්ගේ සිත් රූ 2019 සංස්කෘතික ප්‍රසංගය සඳහා දිස්ත්‍රික් මට්ටමින් කණ්ඩායම් තරඟ පැවැත්වීම. ( පුහුණු කටයුතු අනෙකුත් අවශ්‍යතා සඳහා - 25 X 40,000) | දිස්ත්‍රික්ක 25 | 17.00 | 16.35 | අභ්‍යාසලාභීන් 375 |
| | ආබාධ සහිත වූවන්ගේ ජාතික සංස්කෘතික කලා ප්‍රසංගය හා සම්මාන උළෙල - "සිත් රූ 2019" | නෙළුම්පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල - 2019 සැප්තැම්බර් 26 | | | අභ්‍යාසලාභීන් 135 |
| **02** | ආබාධ සහිත වූවන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල -2019 සඳහා දිස්ත්‍රික් මට්ටමින් තරඟ පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලබාදීම | දිස්ත්‍රික් 25 | | | අභ්‍යාසලාභීන් 4000ක් පමණ |
| | ආබාධ සහිත වූවන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල - 2019 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය 2019 නොවැම්බර් 26 | | | අභ්‍යාසලාභීන් 600 |
| **03.** | දෙපාර්තමේන්තුව යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත දරුදැරියන්ගේ බක්මහ උළෙළ | බත්තරමුල්ල ජී.එච්. බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී - 2019 අප්‍රේල් 04 | | | අභ්‍යාසලාභීන් 700 |
| එකතුව | | | 17.00 | 16.35 | |

❖ මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම , සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම මෙම වැඩසටහන මගින් සිදුකෙරේ. හෙරොයින්, ගංජා, කේරළ ගංජා, මද්‍යසාර, මත්පෙති හා වෙනත් මත්ද්‍රව්‍ය භාවිතය නිසා ජීවිතය අඳුරුකරගත් පිරිස් ආයතන ගත කර පුද්ගල සංවර්ධන ක්‍රියාවලියකට යොමු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

ආයතනයට ඇතුළත් වීමෙන් පසු ප්‍රධාන වශයෙන්ම සිදුකෙරෙනුයේ මනෝචිකිත්සක, මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේදයන් හා වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු කිරීමයි. එම කාලය තුළ අභ්‍යාසලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා යෝගී ව්‍යායාම භාවනා හා ආගමික වැඩසටහන් පැවැත්වීම සිදු කෙරේ. අභ්‍යාසලාභීන් පුනරුත්ථාපනය වන කාලය තුළ නේවාසික පහසුකම්, ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ. අභ්‍යාසලාභීන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීමේ පුහුණුවක්ද නේවාසික කාලය තුළ ලබා දෙනු ඇත.

ආයතනගත පුනරුත්ථාපනය සිදු කරන අතරම දිවයිනේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම සේවා වසම් හරහා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ හා පවුල් සංවර්ධන වැඩසටහන් ද මේ යටතේ ක්‍රියාත්මක කෙරේ.

**2019 මත්ද්‍රව්‍ය වර්ගය අනුව අභ්‍යාසලාභීන් ආයතනගත වීම**

| මත්ද්‍රව්‍ය වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| හෙරොයින් | 255 | 59.44% |
| ගංජා/ කේරල ගංජා | 94 | 21.91% |
| මධ්‍යසාර | 48 | 11.01% |
| මත්පෙති | 28 | 6.52% |
| වෙනත් /විවිධ | 04 | 0.93% |
| එකතුව | 429 | 100% |

**මත් නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

**216- 02-03-2-1501 – (2019/12/31) දිනට**

| ක්‍රියාකාරකම | 2019 ප්‍රතිපාදන (රු.මි.) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31වනදින දක්වා මූල්‍ය හා භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් තුළ මත් ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව (එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රු. 25,000X19) | 0.475 | 0.475 | තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරිම. |
| ප්‍රගති සමාලෝචන රැස්වීම - ප්‍රධාන කාර්යාලය | 0.055 | 0.055 | සමාජ සේවා නිලධාරීන්/ සමාජ සංවර්ධන නිලධාරින් හා සංවර්ධන නිලධාරීන් 20ක් |

## 2.2 විශේෂ ජයග්‍රහණ

- 2017 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මාර්ගගත ක්‍රමයට (online) රජයේ ආයතන ඇගයීමේ දී ශ්‍රී ලංකාවේ දෙපාර්තමේන්තු අතරින් හොඳම දෙපාර්තමේන්තුවක් ලෙස 2019 ජූලි 05 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව රන් සම්මානයෙන් පිදුම් ලැබීම.

- උතුරු නැගෙනහිර පළාත් දෙක සඳහා මඩකලපුව සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කයන්හි අබාධ සහිත තරුණ තරුණියන් හට වෘත්තිය පුහුණුව ලබා දීම සඳහා නව වෘත්තීය පුහුණු ආයතන දෙකක් ඉදිකිරීම.

- කොට්ටාව ප්‍රදේශයේ ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයක් සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

## 2.3 අභියෝග

- දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතනවලින් පිටවන වෘත්තීය පුහුණුලාභීන් රැකියාගත කිරීම.
- ආබාධ සහිත වූවන් පුනරුත්ථාපනය කිරීමේදී පුනරුත්ථාපන සැලසුම් සකස්කිරීම හා එම සැලසුම් වලට අනුකූලව ක්‍රියාකාරකම් සිදු කිරීම.
- දිගුකාලීනව රැකවරණය අවශ්‍ය ආබාධ සහිත දරුවන් සඳහා ආරක්ෂාව,රැකවරණය ලබා දීම සඳහා ප්‍රමාණවත් සම්පත් හා පහසුකම් නොමැතිවීම.
- රෝහල් සුභසාධන සේවාවන්වල නියුතු නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සැලසීම හා සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම.
- සමාජ සේවා දෙපාර්තමේන්තුවට අනුමත තනතුරු පුරප්පාඩු මෙතෙක් සපුරා නොමැති වීම.

## 2.4 ඉලක්ක

- මන්ද මානසික කාන්තාවන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් ඇති කිරීම.
- කිලිනොච්චිය හා මඩකලපුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- තෝරාගත් වෘත්තීය පුහුණු පාඨමාලා කිහිපයක් සඳහා NVQ සහතික පත්‍ර පිරිනැමීම.
- වෘත්තීය පුහුණු ආයතනයන්හි වගා නොකළ බිම් කොටස් වගා කිරීම තුළින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම.
- මන්ද මානසික ආබාධ සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුවට යොමු කිරීමට පෙර පූර්ව සූදානම් කිරීම සඳහා ආයතනයක් ඇති කිරීම.
- දෙපාර්තමේන්තුවේ දැනට පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම.
- ආබාධ සහිත පුද්ගලයන්ගෙන් සමන්විත ස්වශක්ති කණ්ඩායම් වල නිෂ්පාදන අලෙවි ප්‍රදර්ශනයක් පැවැත්වීම.
- 2020 වර්ෂයේ සිට සියලු නිලධාරීන් හට පැවරී ඇති රාජකාරී ස්වභාවය මත විෂයානුබද්ධ පුහුණු කිරීම් සඳහා යොමු කරවීමට අංක 02/2018 හා 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.

..............................

**ගණන් දීමේ නිලධාරී**

**නම:-**

**තනතුර:-**

**දිනය:-** 2020.07.03

## පරිච්ඡේදය 03

### වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**ඒසීඒ - එෆ්**

රු

| අයවැය (2019) | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| | ආදායම් ලැබීම් | | | | |
| | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| | අන්තර්ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | |
| | **මුළු ආදායම් ලැබීම්(අ)** | | **-** | **-** | |
| | ආදායම් නොවන ලැබීම් | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 317,033,930 | 315,574,550 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 1,831,683 | 1,060,523 | ඒසීඒ- 4 |
| | අත්තිකාරම් ගිණුම් | | 22,662,524 | 22,882,669 | ඒසීඒ-5 |
| | වෙනත් ලැබීම් | | - | - | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **341,528,137** | **339,517,742** | |
| | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)** | | **341,528,137** | **339,517,742** | |
| | අඩු කළා: වියදම | | - | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම | | - | - | |
| 372,000,000 | වේතන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 359,594,587 | 335,890,806 | |
| 106,300,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 96,687,957 | 97,788,566 | ඒසීඒ-2(ii) |
| 102,223,770 | සහනාධාර,ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 86,957,233 | 87,305,074 | |
| | පොළී ගෙවීම් | 8 | - | - | |
| 216,230 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 174,230 | 56,000 | |
| **580,740, 000** | **මුළු පුනරාවර්තන වියදම්(ඇ)** | | **543,414, 007** | **521,040,446** | |
| | මූලධන වියදම | | | | |
| 8,460,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 10 | 6,242,589 | 4,569,628 | |
| 144,500,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 79,927,983 | 119,956,774 | |
| | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | - | - | ඒ.සී.ඒ 2(ii) |
| | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | | |
| 3,300,000 | හැකියා වර්ධනය | 14 | 2,696,159 | 3,506,443 | |
| 16,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 12,542,296 | 14,506,661 | |
| **172,260,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **101,409,027** | **142,539,506** | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 21,901,929 | 25,744,968 | |
| | තැන්පතු ගෙවීම් | | 1,731,723 | 1,143,523 | ඒසීඒ- 4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 20,170,206 | 24,601,445 | ඒසීඒ 5 |
| 753,000,000 | මුළු වියදම උ = (ඇ+ඉ+ඊ) 2019 | | 666,724,963 | 689,324,920 | |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ - උ)** | | **(325,196,826)** | **(349,807,178)** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ - පී**

**2019දෙසැම්බර්31දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | | තත්‍ය 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ 6 | | 346,868,862 | 139,818,456 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ 5 | | 52,591,312 | 55,083,630 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ 3 | | | 30 |
| **මුළු වත්කම්** | | | **399,460,174** | **194,902,116** |
| <u>ශුද්ධ වත්කම්/ස්කන්ධය</u> | | | | |
| ශුද්ධ වත්කම් | | | 52,491,352 | 55,083,630 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | | 346,868,862 | 139,818,456 |
| <u>ජංගම වගකීම්</u> | | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ 4 | | 99,960 | |
| අග්‍රිම ශේෂය | ඒසීඒ 3 | | | 30 |
| **මුළු වගකීම්** | | | **399,460,174** | **194,902,116** |

පිටුඅංක 38 සිට 40 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 41 සිට 43 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත්, මෙයින් සහතික කරමු.

| ................................ | ................................ | ................................ |
|---|---|---|
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි | ගණන් දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය) |
| නීල් බණ්ඩාර හපුහින්න<br>ලේකම්<br>කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය<br>4 වන මහල, (දෙවන අදියර) සෙත්සිරිපාය, බත්තරමුල්ල. | | |
| නම : | නම : R A C C රත්නසිරි ආරච්චි | නම : |
| තනතුර : | තනතුර : සහ. ලේකම් (මුදල්) | දිනය : 2020 . 07 . 03 |
| දිනය : 2020 . 07 . 03 | දිනය : 2020 . 07 . 03 | ජේ. ආර්. දෙනවක<br>ප්‍රධාන ගණකාධිකාරී<br>සමාජසේවා දෙපාර්තමේන්තුව<br>02 වන මහල, II අදියර<br>සෙත්සිරිපාය - බත්තරමුල්ල. |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | **2019**<br>රු. | **2018**<br>රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 32,345,862 | 15,379,350 |
| වෙනත් ශීර්ෂ මඟින් එකතුකරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | 299,961,374 | 300,195,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **332,307,236** | **315,574,350** |
| අඩු කළා - මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 248,246,500 | 226,513,608 |
| සහනාධාර සහ මාරු කිරීම් | 71,184,626 | 79,817,113 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 30 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය(ආ)** | **319,431,126** | **306,330,751** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඇ)=(අ)-(ආ)** | **12,876,110** | **9,243,599** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | - | - |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම | - | - |
| අත්තිකාරම් අය කර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඈ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| අඩු කළා - මුදල් වැය කිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 12,976,069 | 10,883,618 |
| අත්තිකාරම් ගෙවීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)** | **12,976,069** | **10,883,618** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඊ)=(ඈ)-(ඉ) | (12,976,069) | (10,883,618) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ)=(ඈ)+(ඊ)** | **(99,959)** | **(1,640,019)** |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | | |
| ප්‍රදානයන් ලැබීම් | | |
| තැන්පතු ලැබීම් | 1,831,682 | 1,640,019 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය(ඌ)** | **1,831,682** | **1,640,019** |
| අඩුකළා - මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | |
| තැන්පතු ගෙවීම් | 1,731,723 | 1,640,019 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ)** | **1,731,723** | **1,640,019** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඒ)=(ඌ)-(එ)** | **99,959** | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ) | | |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාළ නොවේ.**

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ.**

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 582,000 | 580,740 | 543,414 | 93.58% |
| ප්‍රාග්ධන | 171,000 | 172,260 | 101,409 | 58.87% |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාළ නොවේ

### 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්වය වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | 25,986 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | - | 129,832 | - | - |
| **9153** | ඉඩම් | - | - | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| **9160** | කෙරීගෙන යන වැඩ | - | 191,051 | - | - |
| **9180** | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

**3.9** විගණන වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ්/සී/එස්එස්ඩී/විගි/19/0 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 ජූනි 30 දින

**ගණන්දීමේ නිලධාරී**
**සමාජසේවා දෙපාර්තමේන්තුව**

**සමාජසේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

------------------------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමාජසේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජසේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත්



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත්

විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

##### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**( i) භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්**

මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ මුදලින් ලද භාණ්ඩාගාර අග්‍රිම පමණක් ඇතුළත් කළ යුතු වන නමුත් වර්ෂය සඳහා මුදලින් ලද භාණ්ඩාගාර අග්‍රිම රු.299,961,374 ක් වෙනුවට වෙනත් මූලාශ්‍ර ලැබීම්ද සමග සමස්ථ ලැබීම් රු.317,033,930 ක් කාර්යසාධන ප්‍රකාශය තුළ ඇතුලත් කර තිබුණි.

**(ii) අත්තිකාරම් ලැබීම්**

මූල්‍ය ප්‍රකාශන සමග යටතේ ඉදිරිපත් කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් විස්තර අනුව (ඒසීඒ 5) අත්තිකාරම් ලැබීම් රු.20,885,578 ක් වුවද,

දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ලැබීම් රු.22,473,336 ක් වී තිබුණි. ඒ අනුව රු.1,587,759 ක වෙනසක් නිරීක්ෂණය විය.

**( iii) වෙනත් ලැබීම්**

ශේෂ පිරික්සුම අනුව දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද රු.10,085,025 ක් වූ ආදායම් නොවන ලැබීම් මූල්‍ය කාර්සාධන වාර්තාවේ ආදායම් නොවන ලැබීම් යටතේ ඇතුලත් කළ යුතු වුවද, එසේ ඇතුළත් කර නොතිබුණි.

**1.6.1.2 මූලධන වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව වර්ෂය තුළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.79,927,923 ක් වූ නමුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ 5) වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස රු. 5,884,363 ක් පමණක් ඇතුළත් කර තිබුණි. මේ නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල රු.74,043,560 ක වෙනසක් නිරීක්ෂණය විය.තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම වියදම රු.12,976,069 ක් වී තිබුණි. කෙටුම්පත් වාර්තාව සඳහා ගණන්දීමේ නිලධාරී විසින් ලබා දෙන ලද පිළිතුර අනුව ප්‍රතිපාදන නිදහස් කිරීම මගින් බාහිර ආයතන විසින් ඉදිකරන ලද හා මිලදී ගන්නා ලද මූලධන වත්කම්,වටිනාකම් අතර වෙනස්කම් සඳහාහේතුවන බව දක්වා තිබුණි. කෙසේවුවද මේ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුනි.

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට රු.139,818,456 ක් වූ වත්කම් ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු. 341,589,114 ලෙස සංශෝධනය කර තිබූ අතර ඒ හේතුවෙන් රු.201,771,456 ක් වූ වත්කම් වැඩියෙන් සටහන් කර තිබුණි. කෙටුම්පත් වාර්තාව සඳහා ගණන්දීමේ නිලධාරී විසින් ලබා දෙන ලද පිළිතුර අනුව 2019 වර්ෂය තුළදී CIGAS වැඩසටහනට ඇතුළත් කරන ලද වත්කම්වල ආරම්භක ශේෂවල එකතුව 2019 ජනවාරි 01 දිනට CIGAS වැඩසටහනේ ආරම්භක ශේෂ ලෙස පෙන්නුම් කිරීම නිසා මෙම වෙනස සිදුවී ඇතිබව දන්වා තිබුණි. කෙසේ වුවද,ඒ පිළිබඳ විස්තරාත්මක වාර්තා විගණනයට ඉදිරිපත් නොවුනි.

### 1.6.1.3 අත්තිකාරම් ගෙවීම්

---------------------

මූල්‍ය ප්‍රකාශන යටතේ ඉදිරිපත් කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් විස්තර අනුව (ඒසීඒ 5) අත්තිකාරම් ගෙවීම් රු.18,104,865 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් රු.19,845,313 ක් වී තිබුණි. ඒ අනුව රු.1,740,448 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.2 අක්මුදල් ගැලපුම් ගිණුම

------------------------

දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 2019 අංක 271/2019 චක්‍රලේඛයේ 7 වන ඡේදයේ (vi ) වගන්තිය පරිදි වෙනත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ විසින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් කරන ලද වැය කිරීම් ද උපයන ආදායමද දෙපාර්තමේන්තුව විසින් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙනුවෙන් කරන ලද වියදම් හා එකතු කරන ලද ආදායම් ගැලපුම් කරමින් මූල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වටිනාකම හා මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු අගය සැසඳීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුමක් සකස් කල යුතු වුවත් එපරිදි අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

-----------------------

### 1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂ පිරික්සුම අනුව සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් ලැබීම් රු.10,085,025ක් රැස්කර ගෙන තිබුණු අතර අත්තිකාරම් ගිණුම් කටයුතු වලින් මුදල් ලැබීම් රු.22,473,336 ක් වී තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු.32,558,361 ක් දැක්විය යුතු වුවද, ආදායම් නොවන ලැබීම් ලෙස රු.32,345,862 ක් දක්වා තිබීමෙන් රු.212,499 ක් අඩුවෙන් දක්වා තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී පැමිණි නිලධාරියකුගේ ණය ශේෂ නිරවුල්

කිරීමක් වැරදීමකින් මෙම දෙපාර්තමේන්තු ශීර්ෂයට සටහන් කිරීමමෙම වෙනස සඳහා හේතුවී ඇතිබව ගණන්දීමේ නිලධාරී විසින් මා වෙත දැනුම්දී තිබුණි.

(ආ) ශේෂ පිරික්සුම අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් වර්ෂය තුළ රු.228,613,687 ක් මුදලින් වැයකර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.248,246,500 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් රු.19,632,813 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ අත්තිකාරම් බී ගිණුම යටතේ අයකරගෙන තිබූ රු.22,473,337 ක් සහ අත්තිකාරම් ගෙවීම් ප්‍රමාණය වූ රු.19,845,313 ක් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ජනිතවූ මුදල් ප්‍රවාහයන් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 (ආ) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙළ කිරීම ගණන් දීමේ නිළධාරිගේ වගකීම වුවත්, දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 44 ට අදාළව සළසා තිබුණු රු.265,363,770 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.91,856,497 ක් ඉතිරිකර තිබුණු අතර එය ශුද්ධ ප්‍රතිපාදනයන් සියයට 34.6 ක් වී තිබුණි.

(ආ ) සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ ප්‍රතිපාදනවලට අමතරව පුනරාවර්තන වැය විෂයන් 09 ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 01 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් සලසා තිබුණි. එම ප්‍රමාණය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 02 සිට සියයට 252 දක්වා වූ අතර එම මාරු කිරීම්වලින් වියදම් කිරීමේදිද, අවස්ථා 09 ක දී මාරු කළ මුදලින් ද සියයට 08 සිට සියයට 82 දක්වා ඉතිරිවීම් නිරීක්ෂය විය.

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව බැදීම් ඇතිකර ගැනීමට පෙර ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන තහවුරු කරගත යුතුවේ. කෙසේවුවද, දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 05 ක් ප්‍රතිපාදන ඉක්මවා රු.2,458,932 ක් බැරකම් ඇතිකර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 18 ක් වෙනුවෙන් එකතු වටිනාකම රු2,944,805 ක් වූ බැරකම් බැදීම් හා බැරකම් ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ

Athenagama

ටී.ජී.අයි.පද්මිණි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

# පරිච්ඡේදය 04

## ආයතනයේ කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 90% - 100% | 75% - 89% | 50% - 74% |
| ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහන<br>• ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම<br>• වෘත්තීය පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල ලබා දීම<br>• මුල් ළමා විය ආබාධ සහිත දරුවන් සඳහා සේවා සැපයීම<br>• කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ආධාර ලබාදීම | √ | | |
| දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල<br>• ක්‍රීඩා ආධාර ලබා දීම<br>• වෘත්තීය පුහුණු උපදේශක දීමනා ලබා දීම<br>• පුනරුත්ථාපන ආධාර ලබා දීම<br>• අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලබා දීම<br>• ජාත්‍යන්තර සුදුසැරයටි දින සැමරුම් ජාතික උත්සවය<br>• අක්ෂි කාච හා අක්ෂි ප්‍රතිකාර<br>• දෘශ්‍යාබාධිත කාන්තා සුබසාධන මධ්‍යස්ථානය | √ | | |
| ආබාධ සහිත දරු දැරියන්ගේ සංස්කෘතික කලා | | | |

| | | | |
|---|---|---|---|
| කුසලතා වැඩසටහන<br>• ආබාධ සහිත වූවන්ගේ සිත් රූ සංස්කෘතික ප්‍රසංගය - 2019<br>• ආබාධ සහිත වූවන්ගේ ජාතික මලල ක්‍රීඩා උළෙල- 2019<br>• ආබාධ සහිත දරු දැරියන්ගේ බක්මහ උළෙල | √ | | |
| මත් නිවාරණ වැඩසටහන | | | √ |
| නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන | | √ | |
| ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන (සී.බී.ආර්) | | √ | |
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නවීකරණය කිරීමේ වැඩසටහන | √ | | |
| ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඉදිකිරීම(කොට්ටාව) | | √ | |
| වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම(කිලිනොච්චිය,මඩකලපුව) | √ | | |

# පරිච්ඡේදය 05

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG)

| හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශකය | ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0 – 49% | 50 – 74% | 75 – 100% |
| **සමාන සමාජ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා ආන්තික කණ්ඩායම් බල ගැන්වීම.** | වයස අවු 16-35ආබාධ සහිත තරුණ තරුණියන් අවම වශයෙන් 500 දෙනෙකු සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම | වෘත්තීය පුහුණුව නිම කල ආබාධ සහිත තරුණ තරුණියන් සංඛ්‍යාව | | | √ |
| | භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් 75 ක් සඳහා නේවාසික රැකවරණය ලබාදීම. | භාර කරුවන් අහිමි නේවාසික රැකවරණය ලබා දුන් මන්ද මානසික ආබාධ සහිත දරුවන් | | | √ |
| | වයස අවුරුදු 0 -18 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන් 100 දෙනෙකුගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම. | ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත් වූ වයස අවු 0-18ත් අතර ආබාධ සහිත ළමුන් සංඛ්‍යාව | | | √ |
| | **මතට ඇබ්බැහිවූවන් 300 ක් නේවාසික පුනරුත්ථාපනය කිරීම, ඔවුනට වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.** | පුනරුත්ථාපනය කරන ලද මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **දෘශ්‍යාබාධ සහිත ප්‍රජාව සඳහා සමාන අවස්ථාවන් ලබාදීම හා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම** | **සමාන අවස්ථාවන් ලබාදුන් හා අයිතිවාසිකම් සුරක්ෂිත** කරන ලද දෘශ්‍යාබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| | **ආබාධ සහිත තැනැත්තන් සඳහා සමාන අවස්ථාවන් ලබා දීම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම මඟින් ප්‍රජාවේ පුනරුත්ථාපනය** | **සමාන අවස්ථාවන් ලබාදුන් හා අයිතිවාසිකම් සුරක්ෂිත** කරන ලද ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව | | | √ |
| | **ශ්‍රවණාබාධිත වූවන් 500 දෙනෙකු සඳහා ශ්‍රවණාබාධිත හැඳුනුම්පත් ලබා දීම.** | **හැඳුනුම්පත්** ලබාදුන් ශ්‍රවණාබාධිත පුද්ගලයින් සංඛ්‍යාව | | | √ |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් 2019 වර්ෂයේ සංවිධානය කර පවත්වනු ලැබූ ව්‍යාපෘති වැඩසටහන් වලට අදාළ ක්‍රියාකාරකම් බොහොමයක් සඳහා සැලකිය යුතු මට්ටමේ ජයග්‍රහණයන් අත්පත් කර ගැනීමට හැකියාව ලැබී ඇති අතරම ඒ සඳහා වූ ගමන් මඟ තුළ පැවති අභියෝගයන් කිහිපයක් හඳුනාගත හැකිවේ.

- දෙපාර්තමේන්තුවට අනුමත තනතුරු වල පුරප්පාඩු සපුරා නොමැති වීම
- සැලසුම් කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම
- සමාජ සේවා දෙපාර්තමේන්තුව අයත් විෂය භාර අමාත්‍යාංශය වෙනස් වීම මත සැළසුම් කරන ලද වැඩසටහන් ඒ අයුරින් නිසි පරිදි අදාල කාල සීමාව තුළ සිදු කර ගැනීමට අපහසු වීම

## පරිච්ඡේදය 06

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 10 | 7 | 3 |
| තෘතීයික | 488 | 278 | *31 |
| ද්විතියික | 565 | 301 | *62 |
| ප්‍රාථමික | 125 | 111 | 14 |

* තෘතියික මට්ටමට ඇතුළත් සමාජ සේවා නිලධාරි තනතුරු 480 ක් අනුමත වුවද එම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කළ හැකි වනුයේ, MN 4 වැටුප් බණ්ඩයේ සමාජ සංවර්ධන සහකාර තනතුරු දරන්නන් සමාජ සේවා නිලධාරි තනතුරට බඳවා ගැනීමෙනුත්, දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති සංවර්ධන නිලධාරි තනතුරු අහෝසි වී ගිය පසුවත්ය.

* එසේම ද්විතියික මට්ටමට ඇතුළත් MN 4 වැටුප් බණ්ඩයේ සමාජ සංවර්ධන සහකාර තනතුරු හා සංවර්ධන නිලධාරි තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් එම තනතුරු වල ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීමටද හැකියාවක් නොමැත. එබැවින් තෘතීයික හා ද්විතියික මට්ටමට අදාළව සත්‍ය ලෙසම පවතින ඇබෑර්තු සංඛ්‍යාව මෙහි දක්වා ඇත.

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය/අතිරික්තය බලපා ඇති අකාරය

සමාජ සේවා දෙපාර්තමේන්තුවට අදාළව අනුමත කර ඇති තනතුරුවල අතිරික්තයක් නොමැති අතර, පවතිනුයේ කාර්ය මණ්ඩල හිඟයකි. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ දී කාර්ය මණ්ඩල හිඟය බෙහෙවින් බලපාන ලද අතර ඒ හේතුවෙන් පහසුවෙන් හා සුමටව කාර්යන් ඉටු කිරීමට බාධාවන් එල්ලවී ඇත. එනමුදු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති රාජකාරී සඳහා පවතින මානව සම්පත සාධාරණව හා සමානුපාතිකව බෙදාහැරීම තුළින් සේවා අවශ්‍යතා සපුරාලමින් අපේක්ෂිත කාර්ය සාධන මට්ටම කරා ළඟාවීමට මාර්ගෝපදේශනය ලබා දෙන ලදි. එසේ වුවද දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීමට යාමේදී සීමිත වූ මානව සම්පත කාර්යක්ෂමව හා සඵලදායීව ක්‍රියා කරමින් මා හැඟි සේවයක් ඉටු කරන ලදි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසට හනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශී ය | නිමවුම්/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|
| පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය පිළිබඳ දෙදින වැඩමුළුව | 1 | දින 02 | 12,500.00 | දේශීය | නිලධාරීන්ගේ අවශ්‍යතා විශ්ලේෂණය තුළින් සාර්ථකව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම පිළිබඳ දැනුම |
| ප්‍රසම්පාදන විගණනය සම්බන්ධ වැඩමුළුව | 1 | දින 02 | 9,200.00 | දේශීය | ප්‍රසම්පාදන කටයුතු විගණනය පිළිබඳ දැනුම |
| ප්‍රවාහන කළමනාකරණය සම්බන්ධ වැඩමුළුව | 1 | දින 02 | 7,000.00 | දේශීය | ප්‍රවාහන විෂය සම්බන්ධ දැනුම යාවත්කාලීන වීම |
| අත්තිකාරම් බී ගිණුම සකස් කිරීම සම්බන්ධ පුහුණුව | | දින 01 | 5,000.00 | දේශීය | අත්තිකාරම් බී ගිණුම නිවැරදිව සකස් කිරීම |
| ප්‍රසම්පාදනයේ ලංසු කැඳවීම සම්බන්ධ පුහුණුව | 1 | දින 03 | 18,000.00 | දේශීය | ප්‍රසම්පාදනය සම්බන්ධ විධිමත් දැනුම ලැබීම |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විශේෂඥයන් බිහි කිරීමේ සිව්දින වැඩමුළුව | 1 | දින 04 | 13,500.00 | දේශීය | |
| උසස් සිංහල භාෂා පාඨමාලාව | 2 | මාස 06 | 16,000.00 | දේශීය | කාර්යාල කටයුතු සඳහා අවශ්‍ය සිංහල භාෂාව පිළිබඳ දැනුම ලැබීම |
| දෙමළ භාෂා පාඨමාලාව සඳහා ගෙවීම | 1 | මාස 06 | 8,000.00 | දේශීය | දෙමළ භාෂාව පිළිබඳ දැනුම ලැබීම |
| රාජ්‍ය අයතන තුළ විනය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 1 | දින 03 | 12,000.00 | දේශීය | මූලික විනය පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධ දැනුම ලැබීම |
| විදේශ පුහුණු කටයුතු සඳහා නිවාඩු හා දීමනා ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ එක්දින පුහුණුව | 1 | දින 01 | 5,000.00 | දේශීය | විදේශ පුහුණු සඳහා නිවාඩු හා දීමනා ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුම ලැබීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව | 9 | දින 02 | 85,000.00 | දේශීය | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සම්බන්ධ දැනුම ලැබීම |
| උපදේශන පාඨමාලාව සඳහා ගෙවීම | 1 | මාස 06 | 25,000.00 | දේශීය | උපදේශනය සම්බන්ධ දැනුම ලැබීම |
| පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව- | 23 | දින 03 | 100,875.00 | දේශීය | පුහුණු වැඩමුළුවක් පැවැත්වීම සම්බන්ධ දැනුම ලැබීම |
| ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින පුහුණුව | 25 | දින 01 | 100,000.00 | දේශීය | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ මූලික දැනුම ලැබීම |
| අරක්කැමි හා අරක්කැමි සහායක පුහුණුව | 21 | දින 02 | 223,000.00 | දේශීය | නවීන තාක්ෂණික උපක්‍රම භාවිතය හා සූපවේදය පිළිබඳ දැනුම ලැබීම |
| ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ පුහුණුව | | මාස 06 | 187,000.00 | දේශීය | ආබාධ සහිත දරුවන්ට ඉගැන්වීම පිළිබඳ දැනුම ලැබීම |
| ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ පුහුණුව | 40 | දින 02 | 61,718.40 | දේශීය | 2020 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සම්බන්ධ දැනුම ලැබීම |
| නිවාස පාලක, උපස්ථායක වෘත්තීය සංවර්ධන පුහුණුව | 45 | දින 03 | 187,278.00 | දේශීය | ප්‍රථමාධාර,ඖෂධ භාවිතය හා උපදේශනය සම්බන්ධ දැනුම ලැබීම |
| රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව, ලියාපදිංචි හා ගාස්තු මූලික ගෙවීම | 1 | අවු 02 | 200,000.00 | දේශීය | අදාළ විෂය සම්බන්ධ දැනුම ලැබීම |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව- පළමු වාරිකය | 1 | අවු 02 | 25,000.00 | දේශීය | සමාජ සේවා විෂය පථය සම්බන්ධ දැනුම වර්ධනය වීම |
| පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා ගෙවීම- පළමු වාරිකය | 2 | අවු 01 | 50,000.00 | දේශීය | |
| ආබාධ සහිත හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සවිබල ගැන්වීම පිළිබඳ විදේශ පුහුණුව- සිංගප්පූරුව | 1 | දින 05 | 164,505.61 | විදේශීය | ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ පහසුකම් සන්නිවේදනය සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම ලැබීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| වෘත්තීය කුසලතා පුහුණු වැඩසටහන ද.කොරියාව, සියෝල් | 4 | දින 06 | 831,990.00 | විදේශීය | ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ හඳුනා ගැනීම, තක්සේරුව, පුහුණුව හා රැකියාගත කිරීම |
| සංඥා භාෂා පරිවර්තකයන්ගේ ලෝක සමුළුව ප්‍රංශයේ පැරිස් නුවර | 1 | දින 04 | 782,194.91 | විදේශීය | අදාළ විෂය සම්බන්ධ දැනුම ලැබීම |
| Cross Country Learning Workshop on Gender Responsive Budgeting - India | 1 | දින 02 | 32,700.00 | විදේශීය | අදාළ විෂය සම්බන්ධ දැනුම ලැබීම |
| කලාව මූලික චිකිත්සාව - ඉන්දියා විදේශ පුහුණුව | 1 | එක් වරකට සතිය බැගින් සති 02 | 349,672.84 | විදේශීය | අදාළ විෂය සම්බන්ධ දැනුම ලැබීම |
| Knowledge co-Creation programme Japan | 1 | මාස 01 | 238,705.37 | විදේශීය | අදාළ විෂය සම්බන්ධ දැනුම ලැබීම |

### * ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය

ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම සඳහා සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදිමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්ය වේ.

මෙම කාර්ය උදෙසා දායක වෙමින් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ විවිධ අංශ, ආයතන මෙන්ම ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්තව නිලධාරීන් 700 කට ආසන්න පිරිසක් සේවය කරනු ලබයි.

ඉලක්කගත ප්‍රජාව වෙත වඩා කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් සැපයීම උදෙසා මෙම මානව සම්පත විෂයානුබද්ධ දැනුමෙන් හා ආකල්පමය වශයෙන් සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වන අතර එම අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත පදනම් වෙමින් නිලධාරීන්ගේ විෂය දැනුම හා ආකල්පමය සංවර්ධනය උදෙසා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ ආකාරයේ පුහුණු වැඩසටහන් මඟින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය ඉහළ නැංවීම උදෙසා විශාල දායකත්වයක් සපයනු ලබයි.

## පරිච්ඡේදය 07

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | **අනුකූල වේ** | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.1 | මු.රෙ. 134 (2) DMA/ 1- 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්ම සැකසීමට අවශ්‍ය පියවර වර්ෂය තුළ සිදු නොවීම. | 2020 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමට පියවර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්ම සම්පාදනය නොවීම. | මානව සම්පත් සැලැස්ම සකස් කර නොතිබුණද පවත්නා ප්‍රතිපාදන අනුව නිලධාරින් බහුතරයකට වර්ෂය තුළ පැය 12 කට වඩා පුහුණු අවස්ථාවන් සහතික කර තිබේ. |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්ම සම්පාදනය නොවීම. | 2020 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබේ. |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 2.01 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |